# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1654/10 - 2010 මැයි 19 වැනි බදාදා - 2010.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(5) (අ) උප වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, ඉඩම්, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා හා ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන ) පනතෙහි 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (5) (අ) උප වගන්තියේ විධිවිධාන අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව, 2010 මැයි මස 19 වන දින සිට 2010 අගෝස්තු මස 18 වන දින දක්වා පානදුර නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාත්මක කිරීමටත්, යුතුකම් ඉටු කිරීමටත්, විශේෂ කොමසාරිස්වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරියෙකු වන පානදුර, ගොරකපොළ, ගඟ පටුමග, අංක 09 ලිපිනයෙහි, වැලිකන්නගේ සොම්පාල ඉන්ද්‍රසේන විජේසේකර යන අය පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, ඉඩම්,
විදුලිබල හා බලශක්ති, පළාත් පාලන හා පළාත් පරිපාලන,
මිනිස්බල හා රැකී රක්ෂා හා ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2010 මැයි මස 17 වැනි දින.
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

06-37

1A - PG 001145 — 360 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.